**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 26 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,074.35 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. මිලියන 1,000.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 73.42 ක් හෙවත් සියයට 6.83 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | දිනට 31 දෙසැම්බර් 2015 | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 991.54 | 929.72 | 61.82 | 6.23 |
| මූලධන | 82.81 | 71.21 | 11.60 | 14.01 |
| **එකතුව** | **1,074.35** | **1,000.93** | **73.42** | 6.83 |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 35 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.මිලියන 3,883.24 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,084.62 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 798.62 ක් හෙවත් සියයට 21 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 56.96 | 49.17 | 41.96 | 52.05 | 200.00 | 190.36 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 436.60 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0069/000 | 0.399 |
| 6000/0000/00/0002/0093/000 | 0.007 |
| 6000/0000/00/0013/0061/000 | 10.395 |
| 6000/0000/00/0016/0014/000 | 336.797 |
| 6000/0000/00/0017/0023/000 | 89.002 |
| **එකතුව** | **436.600** |

## 2.4 විගණන නිරීක්ෂණය

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 වන ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන එක් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, ලේඛන දෙකක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් පවත්වා නොතිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් යාවත්කාලීන කර නොතිබුණි |
| (ඇ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 44 කට හා ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 05 කට 2016 ජූනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 49.88 ක් වී තිබුණි.

### 3.3 විසර්ජන ගිණුම

#### 3.3.1 අයවැය විචලනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශීර්ෂයට අදාළව 2015 වර්ෂයේ සිදුකරන ලද මුදල් රෙගුලාසි 66 හා 69 මාරුකිරීම් මගින් අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබූ වැය විෂයයන් 05 ක ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් වියදම් දැරීමෙන් අනතුරුව තවදුරටත් ඉතිරිවීම් සියයට 10 සිට සියයට 12 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

-----------------------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී අනාවරණය වු නිරීක්ෂණ පහත සඳහන් වේ.

(අ) දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ළය චිකිත්සාගාර ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 18 දින ඉඩම නිදහස් කිරීමට පෙර රු.මිලියන 4.78 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. 2016 ජුනි 20 දින වනවිටත් කර්මාන්තයේ වැඩ ආරම්භ නොකිරීම නිසා රජයේ මුදල් අවභාවිත වී තිබුණි.

(ආ) කඹුරුපිටියේ ජාතික පාසලක රු. මිලියන 8.00 ක වියදමින් ඉදිකර තිබූ තාප්පය බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් කඩා ඉවත් කිරීම නිසා නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත එය නැවත ඉදිකිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් කොන්ත්‍රාත් ආයතනයක් සමඟ රු. මිලියන 6.46 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2015 දෙසැම්බර් 29 දින රු.184,221 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද, කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු අවිධිමත් ආකාරයට සිදුකර තිබුණි. 2016 ජූලි 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

(ඇ) දැයට කිරුළ වැඩසටහන යටතේ තොටමුණ ධීවර ජැටියෙහි දෙවන අදියර ඉදිකිරීම වෙනුවෙන් මාතර ප්‍රාදේශීය ලේකම් විසින් ගොවි සංවිධානයක් සමඟ රු.මිලියන 1.46 ක ගිවිසුමකට එළඹී තිබුණි. පරීක්ෂණ වාර්තා මගින් ඉදිකිරීම් අසාර්ථක බව වාර්තා වීම හේතුවෙන් මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් අත්හිටුවා තිබුණි. එසේ තිබියදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 අප්‍රේල් 21 දින රු.මිලියන 1.50 ක ප්‍රතිපාදන නැවත පවරාගෙන 2015 ජූලි 02 දින රු. මිලියන 1.45 ක මුදලක් අදාළ සමිතිය වෙත ගෙවා තිබුණි. නියමිත ප්‍රමිතියට අනුව ධීවර ජැටිය ඉදි නොකිරීම නිසා ගෙවන ලද මුළු මුදලින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

(ඈ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2012 අගෝස්තු 29 දින රු.මිලියන 1.92 ක වියදම් දරා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. 2016 ජුනි 01 දින වන විටත් සම්පූර්ණ කැමරා පද්ධතියම අක්‍රියවී තිබුණි.

(ඉ) ගම් නඟාසිටුවීමේ වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කර තිබුණු කර්මාන්ත හා ව්‍යාපෘති පිළිබඳ සිදු කරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘති දෙකක් ඉටු කිරීම සඳහා හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. මිලියන 1.96 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද, අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර අවලංගු කර තිබුණි.

(ii) පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගිවිසුම්ගතවී තිබූ රු.මිලියන 1.47 ක් වූ ව්‍යාපෘති 2 ක් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) පස්ගොඩ නාපත්ඇල්ල මධ්‍යම බෙහෙත් ශාලාවට මාතෘ සායන ඒකකයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ගොවි සංවිධානයක් වෙත පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් 2015 දෙසැම්බර් 31 දින රු.882,000 ක් ගෙවා තිබුණි. අදාළ කර්මාන්තය මහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකර තිබුණද, ඉහළ මාලයට යාම සඳහා පියගැට පෙළක් යොදා නොතිබුණි. එමෙන්ම අදාළ කර්මාන්තයේ වැඩ

අවසන් කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැතිවීම මත කර්මාන්තය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණ බැවින්, සිදු කරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.

(iv) තැන්නහේන - පුහුල්හේන වලකඩ මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් 2015 දෙසැම්බර් 31 දින රු.437,454 ක් ගෙවා තිබුණි. කර්මාන්තය නියමිත ප්‍රමිතියට අනුකූලව ඉටුකර නොතිබූ අතර, ඉටු නොකරන ලද වැඩ කොටස් 03ක් වෙනුවෙන් රු.42,393 ක්ද ගෙවා තිබුණි.

(v) පස්ගොඩ බෙංගමුව බටහිර, කිරිවන්දෙනිය ගල්ගොඩහේන මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත 2015 දෙසැම්බර් 31 දින රු.435,572 ක් ගෙවා තිබුණි. කර්මාන්තය නියමිත ප්‍රමිතියට ඉටුකර නොතිබුණු අතර ඉටු නොකරන ලද වැඩ කොටස් 02 ක් වෙනුවෙන් රු.63,143 ක් ගෙවා තිබුණි.

(vi) පස්ගොඩ කැරුල්ලෝවිට ප්‍රජාශාලාව ඉදිකිරීම වෙනුවෙන් ගොවි සංවිධානයක් වෙත 2015 දෙසැම්බර් 31 දින රු.609,977 ක් ගෙවා තිබූ නමුත්, රු.339,137 ක් වූ වැඩ කොටස් නියමිත ප්‍රමිතියට අනුව ඉටුකර නොතිබුණි.

(vii) කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කරතොට ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත 2015 දෙසැම්බර් 14 දින රු.989,800 ක් ගෙවා තිබුණද, කර්මාන්තය ගිවිසුම ප්‍රකාරව ඉටුකර නොතිබුණි. ගිවිසගත් මුදල තුළ කර්මාන්තයේ වැඩ අවසන් කළ නොහැකි බැවින් ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි. මේ නිසා වැය කළ මුදල අනාර්ථික වී තිබුණි.

(ඊ) පළාත් නැගුම වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කර තිබුණු කර්මාන්ත හා ව්‍යාපෘති පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) කුඹල්ගම සතිපොළ ඉදිකිරීම සඳහා 2014 දෙසැම්බර් 31 දින රු. මිලියන 1.94 ක අත්තිකාරම් මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවා තිබුණි. 2016 ජූනි 20 දින වන විටත් කර්මාන්තයේ වැඩ ආරම්භ කර නොතිබුණු අතර, අත්තිකාරම් ගෙවා මාස 17 කට වැඩි කාලයක් අවභාවිතව පැවතුණි.

(ii) දෙනිපිටිය නැගෙනහිර හා බතලහේන බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රමාද ගාස්තු අය නොකර පිළිවෙලින් රු.මිලියන 1.36 ක් හා රු. මිලියන 1.38 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. 2016 ජූනි 20 දින වන විටත් දක්වා අදාළ ගොඩනැගිලි ප්‍රයෝජනයට ගත හැකි මට්ටමක නොතිබූ හෙයින් වැය කර තිබුණු මුදල අනාර්ථික වී තිබුණි.

(උ) 2014 සංවර්ධන සැලැස්ම යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එගොඩහවත්ත සිට පන්සල පාර සංවර්ධනය කිරීම සඳහා 2015 අගෝස්තු 06 දින රු.428,368 ක් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට ගෙවා තිබුණි. තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව කර්මාන්තය නියමිත ප්‍රමිතියෙන් තොරව ඉදිකිර තිබුණු බව තහවුරු විය.

(ඍ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක සංවර්ධන සැලැස්මේ 2014 වර්ෂයට අදාළ 2015 වර්ෂය සඳහා අවිච්ඡේද වූ රු.562,028 ක කර්මාන්ත 4 ක් සඳහා ගිවිසුම්ගතවී තිබුණි. 2016 ජනවාරි 08 දින වන විටත් අදාළ කර්මාන්තවල වැඩ ආරම්භ කර නොතිබුණි.

(එ) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයෙන් 2015 වර්ෂයට අවිච්ඡේද වූ එකතුව රු. මිලියන 1.90 ක මහජන නියෝජිතයින්ගේ විශේෂ ව්‍යාපෘති 03 ක් හා රුහුණු උදානය යටතේ ආරම්භ කරන ලද එකතුව රු. මිලියන 5.19 ක් වූ ව්‍යාපෘති 04 ක් 2015 දෙසැම්බර් 31 දින වනවිට අත්හැර තිබුණි.

(ඒ) මාතර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මැදගෙදරවත්ත මාර්ගයේ පොල්හේන පාරේ පැති කාණුව දක්වා ජල බස්නා කාණුව ඉදිකිරීම වෙනුවෙන් රු.959,868 ක් ගෙවා තිබුණි. 2015 සැප්තැම්බර් 22 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී අනුමත නොවූ වැඩ කොටස් හා ව්‍යාජ වැඩ කොටස් ඇතුළත් කර එකතුව රු.559,357ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඔ) විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මාතර දිස්ත්‍රික්කයේ පාසල්වල පරිගණක විද්‍යාගාර සඳහා පරිගණක මේස 50 ක් හා පුටු 100 ක් ලබාදීම වෙනුවෙන් 2015 ජුනි 04 දින එකතුව රු. මිලියන 2.10 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නියමිත පරිදි අනුගමනය නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු විසින් අතරමැදියෙකු මාර්ගයෙන් භාණ්ඩ ලබාගෙන බෙදාහැරීම් කර තිබුණි.

(ඕ) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාතර යොවුන් උදානය ඉදිකිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගැනීමට 2015 වර්ෂයේදී රු.මිලියන 142.31 ක වන්දියක් ගෙවා තිබුණි. අදාළ ඉදිකිරීමේ කටයුතු සඳහා රු. මිලියන 6.00 ක වියදම් කිරීමෙන් පසු ව්‍යාපෘතියේ වැඩ අතරමඟ නවතා තිබුණි.

(ක) සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ඉඩමක් රජයට පවරාගෙන 2015 මැයි මාසය වන විට රු. මිලියන 11.50 ක වියදම් කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. 2015 සැප්තැම්බර් මාසයේදී එහි සියළු ඉදිකිරීම් කටයුතු නවතා තිබුණි. ඉදිකිරීම් සිදු නොකෙරෙන බැවින්, වන්දි මුදල් නැවත ගෙවීමේ පදනමට යටත්ව ඉඩම නැවත පවරාදෙන ලෙස ඉඩමේ අයිතිකරු විසින් ඉල්ලා තිබුණි.

(ග) මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රු. මිලියන 17.86 ක් වැයකර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 32 ක් ගිවිසුම් ප්‍රකාරව ඉටු නොකර අත්හැර තිබුණි. ඉන් රු. මිලියන 1.18 ක්වූ ව්‍යාපෘති 08 ක කටයුතු ඇස්තමේන්තු සකස් කිරීමට පමණක් සීමා කර තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක කාලයක් ඉක්මවූ රු.322,173 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 26201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය, සේවයෙන් පහකළ හා සේවය අත්හැර ගිය නිලධාරීන් 16 දෙනෙකුගෙන් 2016 ජුලි 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව

රු.1,488,700 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත්වී තිබුණි.

## 3.6 වත්කම් කළමණාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ත්‍රිරෝද රථය වර්ෂ එකහමාරක සිට ඌණ උපයෝජිතවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වෙහෙරගම්පිට පිහිටි රජයේ නිවාස 02 ක් වසර හතරක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

### (ආ ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක භාණ්ඩ අයිතම 60 කට අයත් භාණ්ඩ ඒකක 652 ක ඌනතාවයන් අනාවරණය වී තිබුණු නමුත්, ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.7 අනුකූල නොවීම්

### (අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරික්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 136 සිට 139 දක්වා | 11,008,700 | මිලදී ගැනීමට යෝජිත භාණ්ඩවලට අදාළ තාක්ෂණික ඇගැයීම් කමිටු වාර්තා ලැබීමට පෙර 2015 දෙසැම්බර් 31 දින චෙක්පත් 03 ක් ලියා පසුව අවලංගු කිරිමට පියවර ගෙන තිබුණි. |
| (ii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශය | 1,892,757 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේදී, ඉකුත් වර්ෂයේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ කරගත් ප්‍රසම්පාදන තීරණය මත සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. |

(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

-------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ආකාරයෙන් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක් විසින් සක්‍රීයතාවය තහවුරු කර නොගෙන භාණ්ඩ හා සේවාවන් සපයන සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට එකතුව රු.4,213,769 ක්වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි.

(ii) එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණු කොන්ත්‍රාත්කරුවෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතු කළ අගය මත බදු වශයෙන් රු.166,660 ක් ගෙවා තිබුණි.

**3.8 කාර්යසාධනය**

----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කර නොතිබූ අවස්ථා පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම 2015 ජූලි 31 දිනෙන් අවසන් විය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා, එකතුව රු. මිලියන 3.06 ක් වටිනා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ 2015 ජූලි 31 දින වන විටත් 2015 දෙසැම්බර් 31 දිනත් අතර කාලය තුළ අවස්ථා 23 කදී මිලදීගෙන තිබුණි. එම අගය වර්ෂයේ මුළු මිලදී ගැනීම්වලින් සියයට 93 ක් වී තිබුණි.

(ii) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම 2015 ජූලි 31 දිනෙන් අවසන් විය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රු.222,980 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 2015 ජූලි 31 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කාල පරාසය තුළ අවස්ථා 4 කදී මිලදීගෙන තිබූ අතර, එම අගය වර්ෂයේ මුළු මිලදී ගැනීම්වලින් සියයට 94 ක් වී තිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේදී නව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 1.82 ක වියදමින් ඩෙස්ක් ටොප් පරිගණක 20 ක් හා රු.445,000 ක වියදමින් ලැප්ටොප් පරිගණක 05 ක් මිලදීගෙන තිබුණි. කෙසේ වුවද, එම භාණ්ඩ අනුමත පිරිවිතරවලට අනුකූලවී නොතිබුණු අතර, රු.182,000 ක් වූ ඩෙස්ක්ටොප් පරිගණක 2 ක් හා ලැප්ටොප් පරිගණක 05 අදාළ අරමුණුවලින් බැහැර වූ කාර්යයන් සඳහා භාවිතා කර තිබුණි.

**3.10 අවිධිමත් ගනුදෙනු**

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර ඒවා විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කොන්ත්‍රාත්කාර සමිතියක් සමඟ ගිවිසුම්ගතව එළඹ තිබුණි. ඒ ගැන නොසලකා 2015 දෙසැම්බර් 31 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.1,687,238 ක චෙක්පතක් කොන්ත්‍රාත්කරු නමින් ලියා පසුව 2016 පෙබරවාරි 17 දින ප්‍රාදේශීය ලේකම්,

දෙවිනුවර ලෙස වෙනස්කර ප්‍රාදේශීය ලේකම් වෙත යවා තිබුණි. කර්මාන්තයට අදාළව බාහිර වැඩ සඳහා රු.272,606 ක්ද හා අමතර වැඩ සඳහා රු.145,645 ක්ද වශයෙන් රු.418,251 ක වැඩ සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු විසින් අනුමැතිය ලබා දී නොතිබුණි. ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.557,108 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

(ආ) කර්මාන්තයට අදාළ ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 136 සිට 139 දක්වා වූ රෙගුලාසිවල විධිවිධාන අනුගමනය නොකර අවිධිමත් ලෙස රු.මිලියන 1.69 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ආ) මාතර වෙහෙරගම්පිට පිහිටි සහකාර දිස්ත්‍රික් ලේකම්ට වෙන් කර තිබුණු නිවස අළුත්වැඩියා කිරීම සඳහා සමෘද්ධි සමිතියක් සමඟ රු.මිලියන 1.40 කට ගිවිසුමකට එළඹ තිබුණි. අදාළ ඇස්තමේන්තුව හා බිල්පත්‍ර දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර නොතිබුණි. එම කර්මාන්තයේ ඉටු කළ රු.මිලියන 1.19 ක් වූ වැඩ වටිනාකම සඳහා විධිමත් පරිදි ප්‍රමාණ පත්‍ර පිළියෙල කර නොතිබුණි. ඉටුකළ වැඩවලින් නිශ්චිතව හඳුනා නොගත් වැඩ කොටස් සඳහා රු.446,000 ක් 2014 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. රඳවුම් මුදල් අඩු කර 2015 අප්‍රේල් 07 දින රු.623,634 ක මුදලක් අනුමත නොකර ගෙවා තිබුණි.

**3.11 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරාසයක් තුළ සිදුවී තිබුණු වාහන අනතුරු 30 කට අදාළ හානිවල එකතුව රු.මිලියන 1.89 ක් වී තිබුණි. මෙම පාඩු හා හානි කපා හැරීමට හෝ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සුනාමි අවස්ථාවේ සිදුවූ අලාභ හානි සහ වැටුප් මංකොල්ලකෑම් ආදී අලාභ සඳහා වසර 5 සිට වසර 18 ක් දක්වා කාල පරාසයට අයත් එකතුව රු.මිලියන 15.32 ක් වූ හානි හා පාඩු සිද්ධීන් 05 කට අදාළව ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් මෝටර් රථයක් 2011 දෙසැම්බර් 25 දින අනතුරකට ලක්වීමෙන් රු.1,817,098 ක අලාභයක් සිදුවී තිබුණි. අදාළ අනතුර සම්බන්ධයෙන් නොසැළකිල්ලෙන් හා අවිධිමත්භාවයෙන් කටයුතු කිරීම නිසා රජයට සිදුවී තිබුණු රු.103,213 ක පාඩුවක් රථයේ රියදුරුගෙන් අයකර ගන්නා ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2014 මාර්තු 28 දින දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා තිබුණි. ඊට අනුකූලව කටයුතු නොකර එම තොරතුරු වසන් කර එම අලාභය කපා හැරීමට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගෙන් නැවත අනුමැතිය ලබාගෙන තිබුණි.

**3.12 විසඳා නොතිබුණු විගණන ඡේද**

-------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව 2006 විගණකාධිපති වාර්තාවේ 7.4 (ඇ) ඡේදයේ ඇතුළත්ව තිබුණු ගන්දරවැල්ල ධීවර ගම්මානයේ රේන්ද පොළ ඉදිකිරීම සම්බන්ධව පසු විපරම් කටයුතු 2016 ජුනි 30 දින වනවිටත් නිම කර නොතිබුණි.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 52 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 34 | 22 | 13 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 1255 | 1426 | 61 | 232 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 142 | 145 | - | 03 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 06 | 02 | 04 | - |
| | **එකතුව** | **1,493** | **1,647** | **82** | **236** |

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ නිලධාරී පුරප්පාඩු 17 ක් පිරවීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලනමය කටයුතු සඳහා බලපෑමක් ඇතිවී තිබුණි.

(ii) ග්‍රාම නිලධාරී පුරප්පාඩු 43 ක්ද පිරවීමට කටයුතු නොකිරීම තුළ බලප්‍රදේශයේ ජනතාවට තම අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය සහයෝගයද ලැබී නොතිබුණි.

(iii) සංවර්ධන නිලධාරීන් ලෙස උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් උපාධිධාරී අභ්‍යාසලාභීන් 95 දෙනෙකුට අනුමැතිය ලබාදී තිබූ නමුත්, දිස්ත්‍රික් ලේකම් **කාර්යාලය** විසින් විවිධ තනතුරු ඇතිකර සංවර්ධන නිලධාරීන් 307 දෙනෙකු බඳවාගෙන තිබුණි. සංඛ්‍යාව 212 ක්වූ අතිරික්ත නිලධාරීන් සඳහා විධිමත් අනුමැතියක් 2016 **මාර්තු** 31 දින වනවිටද ලබාගෙන නොතිබුණි. සමස්තයක් ලෙස ගත්කළ අතිරික්ත නිලධාරීන් 236 ක්ද, පුරප්පාඩු 82 ක්ද සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(iv) කාර්යාලවලට අවශ්‍ය තනතුරු පිළිබඳ නිසි අධ්‍යයනයකින් හා සැළසුමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් අතිරික්ත සේවකයින් බඳවාගෙන තිබූ අතර ඇතැම් අවස්ථාවල එම සංවර්ධන නිලධාරීන් වෙනත් සේවාවල රාජකාරි සඳහා යොදවා තිබූ බව නිරීක්ෂණය විය.